2016.09.01

සියලුම පුවත්පත් කතෘවරුන්
විද්‍යුත් මාධ්‍ය ආයතන අධ්‍යක්ෂවරුන් වෙත,

මහත්මයාණෙනි / මහත්මියණි ,

**<u>"පැරිස් දේශගුණික සම්මුතිය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව කෙතරම් සූදානම්ද?"</u>**
<u>දේශගුණ විපර්යාසයේ වර්තමාන අනාගත අභියෝග පිළිබඳ ජාතික සමුළුව</u>

පරිසර යුක්ති කේන්ද්‍රය, පරිසර අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ ජනතාක්ෂණ ආයතනය එක්ව ශ්‍රී ලංකාවේ ජර්මානු තානාපති කාර්යාලයේ අනුග්‍රහය ඇතිව සංවිධානය කරන දේශගුණ විපර්යාසයේ වර්තමාන අනාගත අභියෝග පිළිබඳ දෙදින ජාතික සමුළුව

- වර්ෂ 2016 සැප්තැම්බර් මස 07 සහ 08 දිනයන්හිදී
- පෙ.ව. 09.00 සිට ප.ව. 5.00 දක්වා
- බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ 'A' පරිශ්‍රයේදී

පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබේ.

දේශගුණ විපර්යාසවලට මුහුණුදීම සඳහා ශ්‍රී ලාංකික සමාජය සහ රාජ්‍ය ආයතන යොමු කිරීමේ ප්‍රමුඛ අවශ්‍යතාවය අවධාරණය කිරීමේ හා පැරිස් දේශගුණ සම්මුතිය දිවයින තුල කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා උනන්දු කිරීමේ අරමුණින් පැවැත්වෙන මෙම සමුළුවට ප්‍රකට විද්වතුන්, පරිසර හා සිවිල් සමාජීය ක්‍රියාකාරීන් හා දේශපාලන නියෝජිතයින් ඇතුළු දෙසියකට ආසන්න පිරිසක් සහභාගී වීමට නියමිත අතර මෙම සමුළුව ආවරණය කිරීම සඳහා ඔබ ආයතනයේ මාධ්‍යවේදියෙකු, ඡායාරූපශිල්පියෙකු, කැමරාශිල්පියෙකු සහභාගීකරවන ලෙසත් මේ සඳහා පුළුල් මාධ්‍ය ප්‍රචාරයක් ලබාදෙන ලෙසත් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

ස්තුතියි.
මෙයට විශ්වාසි,
**පරිසර යුක්ති කේන්ද්‍රය**

....................................
හේමන්ත විතානගේ
විධායක අධ්‍යක්ෂ

(සමාරම්භක උත්සවයේ න්‍යායපත්‍රය හා වැඩසටහන් විස්තරය මේ සමග අමුණා එවමි. වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර 071 433 8844, 0112 683 282 දරන අංක වලින් ජනක අමතන්න.)